ත්‍රිපිටක සාහිත්‍යයේ දැක්වෙන උපමා

මාවෙල අරියවංශ හිමි - ත්‍රිපිටකවේදී උපාධි අපේක්ෂක

ත්‍රිපිටක සාහිත්‍යයේ දැක්වෙන උපමා පැහැදිලියි ප්‍රකටය. එසේම ස්වාභාවිකය. අටුවා කාලය වන තෙක්ම එය නොවෙනස් ව පැවතුණි. අලංකාරය අනුව ඇති ධර්මෝපමා ආදී භේද ද දක්නා ලැබේ. අලංකාර ශාස්ත්‍රයට ගරු කරන අප එසේ කොටස් කර ගනිතත් ඒ උදාහරණ දක්වා ඇත්තෙ සිතාමතා නොවේ. කෘෂිකර්මය , දඩයම, දැව කර්මාන්තය යන තුන සඳහන් ගද්‍යයෙහි) කර්මාන්ත කාරයන් උපමාවට තගා ඇත්තේය. ඒ ඒ කර්මාන්තකාරයන් කටයුතු කරන්නාක් මෙන් පණ්ඩිතයාද තමා දමනය කරන බව මෙයින් සඳහන් වේ.

උදකංහි නයන්ති නෙත්තිකා - උසුකාරා නමයන්ති තේජනං

දරුං නමයන්ති තච්ඡකා - අත්තානං දමයන්ති පණ්ඩිතා (ධම්මපද)

බුද්ධ දේශනාවෙන් වැඩි හරියක්ම උපමාවලින් යුක්තයි. ධර්ම කරුණු අවබෝධ කරවීමෙහිලා බුදුරජාණන් වහන්සේ ඉතා ප්‍රකටවූත් පැහැදිලිවූත් උපමා දක්වා ඇත. එසේම සමහර සූත්‍ර සම්පූර්ණයෙන්ම උපමාවලින් යුක්තයි. ධම්මික සූත්‍රය උදාහරණයකි. මේ මුලු දේශනාවම උපමාවෙන් බැදී ඇති අතරඅග්ගිකඛන්ධෝපමසූත්‍රයද එබඳකි. මැදුම් සගි, දික් සගි, අංගුත්තර සගි යනාදියෙහිද සූත්‍ර නිපාතයෙහිද ධම්මපද, ථේරගාථා ථේරී ගාථා හා වෙනත් සූත්‍ර වලද උපමා රාශියක් දක්නට ලැබේ. යම් යම් සූත්‍ර දේශනාවසානයෙහි යම් යම් පුද්ගලයන්' බුදුරදුන්ට ස්තූති. කිරීම උපමාවලින්ම දක්වා ඇත.

' පින්වත් ගෞතමයන් වහන්ස! යටිකුරු වූවත් උඩුකුරු කරන්නාක් මෙන් වැසුණු දෙයක් අරින්නාක් මෙන්අන්ධකාරයේතෙල් පහනක් පත්තු කරන්නාක් මෙන් මේ දේශනාව කෙළෙහිය ' මෙම උපමාව සූත්‍ර රාශියකම තිබේ. මේ හැර ඉතා ප්‍රසිද්ධ උපමා රාශියක් ත්‍රිපිටකයෙන් තෝරාගත හැක.

i. කුල්ලූපමාව
ii. තාලවත්ථු කථා උපමාව
iii. භස්ත්‍ර උපමාව
iv. මාලුවා ලතා උපමාව
v. ගූථ කූපං උපමාව
vi. තිලක උපමාව
vii. ගොඝාතක උපමාව
viii. වෙදෙහිකාවගෙ උපමාව
ix. මහාහත්ථිපදෝපම) උපමාව
x. මධු පිණ්ඩික උපමාව
xi. කකචූපම උපමාව
xii. අලගද්ද උපමාව
xiii. රථ විනීතොපම උපමාව
xiv. ගොපාලක උපමාව
xv. සාගර උපමාව
xvi. නිවාප උපමාව
xvii. උත්තර උපමාව

යන උපමායි.

බුදුරජාණන් සච්චකයා සමග කළ සාකච්ඡාවේදි උපමාවක් දක්වන බව පැහැදිලිව ප්‍රකාශ කර ඇත. ගාථා වලදී නම්, ඉව, විය, ආදි නිපාත පද යොදයි . සමහර තැන එසේ නොයොදාද උපමාව දක්වා ඇත. වතුරෙන් ගොඩගත් මාළුවා දඟලන්නේ යම්සේද එසේම මිනිසාගේ සිතත් දඟලන බව ධම්මපදයේ දක්වා ඇත. එය කාටත් ඇහැට පෙනෙන ප්‍රත්‍යක්ෂ දෙයකි. එය සිතට නැගෙන විට ලෙහෙසියෙන්ම අවබෝධ කර ගත හැක.

බුදුරජාණන් වහන්සේ සච්චකයා සමග කළ වාදයේදි උපමා කීපයක් දක්වා ඇත. පණ්ඩිත ජනයා යම් යම් දේ උපමාවලින් දැනගන්නා බව එහිදී දෙසූහ. ථේර ගාථාවේ සඳහන්

'මිගං නිලීනං කූටෙන - බලිසෙනෙව අම්බුජං

වානරං විය ලෙපෙන - බාධයන්ති පුථුජ්ජනං'

කාමය නිසා පුහුදුන් මිනිසා විනාශ වන බව කදිමට දක්වා ඇත. මෙම ගාථාවේ දඩයම් තුනක් දක්වා ඇත. සිවුපාවන් වඳුරන් මත්සයන්, අල්ලාගත් පැරණි ක්‍රමද මෙහි විස්තර වේ. රැකසිට දඩුමුගුරුවලින් සිව්පාවුන් මැරීමද බිලී බෑමෙන් මාළු ඇල්ලීමද ලාටු වගීවලින් ඇල්ලීමද එදා පැවතුණි.

සතිපට්ඨාන සූත්‍රයේදී ශරීරය ගැන දේශනා කළ බුදුහු ශරීරය හා එහි අවයව දෙකොන බැඳපු මල්ලක දැමූ මුං තල, මැ ආදියට උපමාකර ඇත. තවද ඉතා ස්වාභාවික උපමාවන් මැදුම් සඟියේ මහා සීහනාද සූත්‍රයේ දක්නට ඇත. වනයෙහි නිදැල්ලේ හැසිරෙන මුවෙක් මිනිසුන් දැක බියවී වනයෙන් වනයට රොදින්, රොදට, පල්ලමෙන් පල්ලමට, කන්දෙන් කන්දට, පැනදුවන්නේ යම් සේද එපරිද්දෙන් මමද විවේක ජීවිතයක් ගත කරන්නට කැළයට ගොස් මිනිසුන් දකිතියි බියෙන් ගොපලුන්, එඬේරන්, තණ කපන්නන්, දර කපන්නන් කැළෑ කපන්නන් දැක කැළයෙන් කැළයට, පල්ලමෙන් පල්ලමට, කන්දෙන් කන්දට දිවීමි.

මෙම උපමාව සිත්ගන්නා සුලුය. කාමය ගැන කළ දේශනාවල කාමය අටැසැකිල්ලකට, මස්වැදැල්ලකට, ගිනි හුලකට, අඟුරු වළකට, සිහිනයකට, සර්ප හිසකට, උපමා කොට ඇත. මෙම උපමා ක්‍රමය මුලින් සඳහන් කලාට මඳක් වෙනස් වේ. ඒ බව

1. අට්ඨි සංකලූපම කාමා වුත්තා
2. මංස පේසූපමා
3. තිණුක්කූපමා
4. අංගාරකාසූපමා
5. සුපිනූපමා
6. අසිසූනූපමා

යන උදාහරණ වලින් පෙනේ. මෙම ක්‍රමය අටුවා කාලය වන තුරුම පැවතුණි.

ආශ්‍රිත ග්‍රන්ථ

බෞද්ධ සාහිත්‍යය - බද්දේගම විමලවංස හිමි